Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 19th July 2021 |

පැමිණිලි පාර්ශවය : එස්.ඩී.එම්. ප්‍රියන්ත මහතා,
අංක : 121, රොක්ලන්ඩ් පාර,
මාගල්කන්ද, මග්ගෝන.

වගඋත්තර පාර්ශවය : ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
පයාගල.

***පැමිණිලි අංකය : HRC/4408/15***

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ සිය පැමිණිල්ල ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2015.11.29 වන දින තමා සුපුරුදු පරිදි තමා හට නිකුත් කර තිබූ බලපත්‍ර ප්‍රකාරව රා කොන්ත්‍රාත්කරුවන්ගෙන් රා ලබාගැනීමට කටයුතු කළ බවත්, රා මැන තමාට අයත් WP – HW 4456 දරණ කැන්ටර් රථයට රා පටවා පිටත්ව යාමට සූදානම් වන අවස්ථාවේදී සිවිල් ඇඳුමින් සැරසුනු පුද්ගලයන් දෙදෙනෙක් තමා අසලට පැමිණ ඔවුන් පොලිසියෙන් බව ප්‍රකාශ කර ලොරිය නවත්වන ලෙසට නියම කළ බවත්ය. පසුව තමා ලොරිය නතර කල බවත්, තමාට පොලිසියට යාමට කථා කළ බවත්, තමා එසේ පොලිසියට යාමට ඇති අවශ්‍යතාවය විමසුවිට එම නිලධාරින් රා ප්‍රවාහනයට අදාළ බලපත්‍ර තුනක් ලබාගෙන ස්ථානාධිපතිවරයාට දුරකථනයෙන් කථා කළ බවත්, ටික වේලාවකට පසුව ස්ථානාධිපතිවරයා එම ස්ථානයට පැමිණ තමා හා ලොරිය අත්අඩංගුවට ගෙන පයාගල පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් සඳහන් කර ඇත. එසේ රැගෙන යාමට පෙර තමාට කම්මුල් පහරක් ගැසූ බව ද තම අතේ තිබූ රා ප්‍රවාහනයට අදාළ බලපත්‍ර සියල්ලම බලෙන් ලබාගත් බවද සඳහන් කර ඇත.

තමා පොලිස් ස්ථානාධිපතිවරයාට තමා නිත්‍යානුකූලව රැකියාව කරන බවට පැහැදිලි කළ නමුත්, ඔහු එය ප්‍රතික්ෂේප කර තමා සතුව තිබූ රු. 8,800/- ක මුදලක් ද, රියදුරු බලපත්‍රයද ලබාගෙන



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail } sechrc@gmail.com

තමා වෙත නඩු පැවරූ බවද, දහවල් 2.00 ට පමණ තමා ඇප මත මුදාහැරිය බවද සඳහන් කර ඇත. නමුත් තමාගෙන් ලබාගත් බලපත්‍ර ආපසු ලබානොදුන් බවත්, ලොරි රථය ද පොලිස් භාරයේ තබාගත් බවත් ප්‍රකාශ කර ඇත. පසුව 2015.11.30 දිනට නඩුව නියමිතව තිබූ අතර, එදින තමා තමාගේ නිර්දෝෂීභාවය අධිකරණයට ඉදිරිපත් කළ බවද දක්වා ඇත.

පැමිණිලිකරු මෙම පැමිණිල්ලෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, නීතිපතිතුමාගේ 2009.07.07 දරණ CS 2/09/2000 චක්‍රලේඛනය අනුව සහ ගරු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු SCFR 450/2005 දරණ නඩු තීන්දුව අනුව මෙලෙස තමා වෙත නඩු පැවරීම නීතියට පටහැනි බවයි.

තමාට විරුද්ධව පැවති කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක : 53355 දරණ නඩුවේදී, තමාට විරුද්ධව නඩු පැවරීමට පොලිසියට බලයක් නොමැති බව තමාගේ නීතිඥවරු අධිකරණය වෙත ප්‍රකාශ කර සිටි බවත්, එම නඩුව විභාග කිරීම සම්බන්ධයෙන් කළුතර මහාධිකරණයේ ප්‍රතිශෝධනයක් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව පොලිසියට සුරාබදු පනත යටතේ නඩු පැවරීමට නොහැකි බව මහාධිකරණයේ දී ප්‍රකාශ කර සිටි බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු පැමිණිල්ල සනාථ කිරීම සඳහා කළුතර පළාත් බද මහාධිකරණයේ නඩු අංක : ප්‍ර.නි.08/2016 නඩු තීන්දුවෙහි පිටපතක් සහ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : 456/2005 දරණ නඩුවේ නියෝගයේ පිටපතක් ද ඉදිරිපත් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පළවන වගඋත්තරකරු කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, 2015.11.29 වන දින පයාගල පොලිස් වසමේ කළමුල්ල, මඩම පාරේදී බලපත්‍ර නොමැතිව රා ප්‍රවාහනය කළ HW 4456 දරණ ලොරි රථයක් මහ රා මි.ලි. 185,000 ක් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් එදින පෙරවරු 10.00 ට අත්අඩංගුවට ගත් බවත්, එම මහ රා ප්‍රමාණය එකින් එක මැන සාම්පල් බෝතල් 5 කට ලබාගෙන දේපළ කුවිතාන්සි අංක : 33/15 ලෙස ඇතුළත් කර අදාළ ලොරි රථය සහ පස්වරු 1.00 සිට 6.00 දක්වා නිකුත් කර තිබූ රා බලපත්‍රය ද ලොරි රථයේ ලියකියවිලි ද රා ප්‍රවාහනය කරමින් තිබූ බැරල් සහ බූලි ද ස්ථානයට ඉදිරිපත් කර සැකකරුවන්ගෙන් ප්‍රකාශ සටහන් කොට 2015.11.30 වන දින කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනීසිටින ලෙසට උපදෙස් දී ඇප මත මුදාහැරිය බවත්ය. සැකකරුගේ දේපළ වශයෙන් ස්ථානයට ඉදිරිපත් කළ රු. 8,800/- ක මුදල ද අංක : බී 653107 දරණ රියදුරු බලපත්‍රය ද හරියාකාරව සැකකරුට භාරදුන් බවත්, කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත් සඳහන් කර ඇත. පසුව කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ 53355 යටතේ 2015.11.30 වන දින කරුණු වාර්තා කළ පසු කළුතර මහාධිකරණය විසින්

නිකුත් කළ නියෝගයට අදාලව සැකකරු නඩුවෙන් මුදාහැර ඇති බවත්, ඉදිරියේ නඩු පැවරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන නියෝග අනුව කටයුතු කිරීමට සුදානම් බවත් දක්වා ඇත.

වගඋත්තරකරුගෙන් කොමිසම විසින් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් ප්‍රකාශ කර ඇත්තේ, තමා විසින් සැකකරුව අත්අඩංගුවට ගත් ස්ථානයට අයත් CO/11/2015 දරණ පස්වරු 1.00 සිට 6.00 දක්වා වලංගු කාලය සඳහන් කර තිබූ නඩු භාණ්ඩ ස්ථානය වෙත ඉදිරිපත් කළ අතර, අනෙක් සියළු ලිපි ලේඛන සැකකරුගේ පියා වෙත ඒ අවස්ථාවේදීම භාරදෙන ලද බව ප්‍රකාශ කළ අතර, එසේම සුරාබදු ආඥා පනතේ 2 වන වගන්තිය අනුව පොලිස් නිලධාරියා ද සුරාබදු නිලධාරියකු ලෙස හඳුන්වාදී ඇති අතර, 8 (1) වගන්තියට අදාළව වැටලීම හා නඩු පැවරීම සම්බන්ධයෙන් බලය ලබාදී ඇති අතර, එම වැටලීම් සිදුකිරීමට සහ අත්අඩංගුවට ගැනීමට නොහැකි බවට මේ වනතෙක් කිසිදු පනතකින් හෝ අධිකරණයකින් නියෝගයක් ලබාදී නොමැති බවයි. එසේම මහාධිකරණ නඩු තීන්දුවේ සඳහන් වන්නේ සුරාබදු පනතේ 52 (1) යටතේ සුරාබදු බලපත්‍ර නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමට පොලිසියට හැකියාවක් නොමැති බවට වන බැවින් මෙම අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූලව සිදුකළ බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ :-**

කළුතර මහාධිකරණ නඩු අංක : ප්‍ර.නි. 8/2016 දරණ නඩු තීන්දුව අනුව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : 556/2009 තීන්දුවට අනුව පොලිස් නිලධාරියෙකුට සුරාබදු පනතේ 52 (1) (අ) වගන්තිය යටතේ වන වැරදි සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට නෛතික බලයක් නොමැති බව තීන්දු කර ඇති බව නිරීක්ෂණය වේ.

නඩු අංක FR 456/2005 දරණ නඩු තීන්දුවෙහිදී ගරු ශ්‍රේෂ්ඨාධිකරණය සඳහන් කර ඇත්තේ සුරාබදු ආඥා පනතේ 52 (1) (අ) යටතේ සිදුකරන වැරදි සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සඳහා පොලිසියට බලයක් නොමැති බවයි.

**නිගමනය :-**

මෙම පැමිණිල්ලට අනුව විසඳිය යුතු කරුණු ලෙස කොමිෂන් සභාවේ අවධානය යොමුකර ඇත්තේ,

1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක් සිදුව ඇත්ද යන්න එනම්, මෙම අත්අඩංගුවට ගැනීම නිත්‍යානුකූල නොවන අත්අඩංගුවට ගැනීමක් ද යන්නත්,

2) වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට විරුද්ධව කටයුතු කිරීම තුලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක් සිදුකර ඇත්ද යන්නත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (ජී) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇත්ද යන්නත් වේ.

පැමිණිල්ලෙන් ඉදිරිපත් වී ඇති කරුණු වලට අනුව මෙම අත්අඩංගුවට ගැනීම නිත්‍යානුකූල අත්අඩංගුවට ගැනීමක් ද යන්න සම්බන්ධයෙන් සොයා බැලීමේදී සුරාබදු ආඥා පනතේ 52(1) වගන්තිය අනුව වරදක් සම්බන්ධයෙන් පොලිස් නිලධාරින්ට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට බලයක් නැති බව සඳහන් වුවත්, සුරාබදු ආඥා පනතේ (2) වගන්තිය අනුව පොලිස් නිලධාරියෙක් ද සුරාබදු නිලධාරියෙක් ලෙස සැලකෙන බැවින්, සුරාබදු වරදක් සම්බන්ධයෙන් වැටලීම් කිරීම හෝ අත්අඩංගුවට ගැනීම සිදුකළ නොහැකි බවට සඳහන් නොවන බැවින් ද,

එසේම ඉහළ අධිකරණ තීන්දු වල ද දක්වා ඇත්තේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට බලය නොමැති බව මිස අත්අඩංගුවට ගැනීමක් හෝ එවැනි වැටලීමක් සිදුකිරීමට නොහැකි බව සඳහන් නොවන නිසා මෙම අත්අඩංගුවට ගැනීම තුලින් 13(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක් සිදුකළ බවට නිගමනය කළ නොහැක.

කෙසේ වෙතත්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති 12(1) ව්‍යවස්ථාව එනම්, නීතිය පසිදිලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන්නයි. ඒ අනුව සුරාබදු ආඥා පනතේ 52 (1) (අ) වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ට පැමිණිලිකරුට එරෙහිව නඩු පැවරීමට නෛතික හැකියාවක් නොතිබියදී එසේ නඩු පැවරීම තුලින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවත්,

එම ව්‍යවස්ථාවේ 14 (1) (ජී) යටතේ සහතික කර ඇති එකලාව හෝ අන් අය සහ සමග යම් නිත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායකයක නියුක්ත වීමට ඇති හිමිකම වගඋත්තරකරුවන් විසින් උලලංඝනය කර ඇති බවටත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රු. 10,000/- ක වන්දි මුදලක් ලබාදිය යුතුය.

02. තවද, වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමු කරන බවද දන්වා සිටිමි.

2021.08.19 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද පැමිණිලිකරුවන්ට දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

B/